# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010
### 2012 ජනවාරි / පෙබරවාරි

### සමාජීය විද්‍යා පීඨය

### ජනසන්නිවේදනය - MACO - E 2025

### සංවර්ධනය, ජනමාධ්‍ය භාවිතය, ආයතන හා සංවිධාන

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "සංවර්ධනය යනු ජීවිතය සමඟ පොර බදින මිනිසුන්ගේ දුප්පත්කම අලෙවි වන ව්‍යාපාරික කර්මාන්තයකි " ලාංකේය සංවර්ධන වැඩසටහන් වල ගුණාත්මකතාව ඇසුරෙන් විමසන්න.

02. "ආසියානු හා අප්‍රිකානු කලාපයේ රටවල සංවර්ධන ක්‍රියාමාර්ග මුළුමනින්ම ජාත්‍යන්තර සංවිධාන මත තීරණය කෙරේ. " මෙම කියමන විවරණය කරන්න.

03. "සංවර්ධනය විෂය ක්ෂේත්‍රය න්‍යායික හා ප්‍රායෝගික වශයෙන් ලොව වර්ධනය වූ ආකාරය පැහැදිලි කරන්න.

04. ප්‍රජා සංවර්ධන වැඩසටහන්හි දී සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම ප්‍රායෝගිකව යොදා ගන්නා ආකාරය උදාහරණ ඇසුරෙන් විමසන්න.

05. අනාගත ලෝකයේ අභියෝගවලට මුහුනදීම සඳහා දැනට පවතින මානව හා භෞතික (පාරිසරික) සම්පත් නිසි අයුරින් පරිහරණය කිරීමෙහි වැදගත්කම තිරසර සංවර්ධනය කථිකාවට විශේෂිතව හඳුන්වන්න.

06. සංවර්ධන ක්ෂේත්‍රයේ දී ජනමාධ්‍යයෙහි දායකත්වය, ඒ පිළිබඳව සිදුකර ඇති අධ්‍යයන හා මෑත කාලීන ගෝලීය අත්දැකීම් ඇසුරෙන් විමසන්න.

07. "සංවර්ධන ගැටළු හඳුනාගැනීමේ සිට ඒවා විසඳීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායික සැලසුම් සකස්කිරීම සහ ප්‍රතිඵල ඇගයීම යනාදී සෑම ක්‍රියාමාර්ගයක්ම විද්‍යානුකූල අධ්‍යයන මගින් සිදුකළ යුතුය. " පැහැදිලි කරන්න.

08. සංවර්ධන වැඩසටහන් සඳහා ජනමාධ්‍ය හා සන්නිවේදන ක්ෂේත්‍ර තුළ භාවිත කෙරෙන නිර්මාණාත්මක වැඩසටහන් ප්‍රභේද උදාහරණ සහිතව විස්තර කරන්න.

************************